ලිංගික ශ්‍රමිකයින් හැඳින්වීම සඳහා සමාජය තුළ විවිධ යෙදුම් භාවිතා වන අතර, ඒ අතරින් ඇතැම් මාධ්‍ය තුළ පවා දැකිය හැකි යෙදුමක් වන්නේ "ගණිකාව" යන්නයි. එසේම "කාන්තාවන් අලෙවි කිරීමක්" ලෙසින්ද ඇතැම් පුවත්පතක සඳහන් වී තිබෙනු දක්නට ලැබිණි.

ගණිකාව වැනි යෙදුමක ගැටළුව වන්නේ, ඒ හා බැඳී තිබෙන සමාජ ගර්හාවයි. එසේම ඒ ඔස්සේ ලිංගික ශ්‍රමිකයින්ව සමාජයෙන් කොන් වීමට ඇති හැකියාවයි.

මෙසේ කරුණු සලකා බලන විට, "ගණිකාව", "කාන්තාවන් අලෙවි කිරීම" වැනි යෙදුම් ඔස්සේ ලිංගික ශ්‍රමිකයින් සහ ලිංගික ශ්‍රමය ලබාදීම හැඳින්වීමේ යෝග්‍යත්වය සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

මෙම පුවත් වාර්තාවන්හි සිරස්තල, පහත ආකාරයෙන් ලිවීම පිළිබඳ ඔබේ අදහස කුමක්ද? එසේ නැතිනම්, ඔබට මෙම සිරස්තල ලිවිය හැකි ආකාරය පිළිබඳ වෙනත් යෝජනා තිබේද?

▪ කටානේ සුවිසල් නිවෙසක පවත්වාගෙන ගිය ලිංගික සේවා ලබාදෙන ස්ථානයක් වටලයි

▪ මීගමුවේ සුපිරි ගේක කසිප්පු ගබඩාවක් සමග ලිංගික සේවා ජාවාරමක්

▪ ඔන්ලයින් එකෙන් ලිංගික ශ්‍රමිකයන් සපයන ගමන් කසිප්පුත් පෙරලා

**#MediaEthicsSL #lka #sinhalanews #Mawbima #Lankadeepa #Divaina**